**දශක තුනක් තිස්සේ උතුරේ පැවැති යුද්ධයේ අවසාන දින කිහිපය තුළදී රජයේ හමුදාවන්ට බාරවූ එල්.ටී.ටී.ඊ. ඉදිරි පෙළ සාමාජිකයන් අතර එම සංවිධානයේ දේශපාලන අංශයේ කාන්තා නායිකාව තමිළිනී ජෙයක්කුමාරන් ද විය. යුද ජයග්‍රහණයෙන් පසුව රජය ක්‍රියාත්මක කළ පුනරුත්ථාපන වැඩ පිළිවෙළ යටතේ නැවත සමාජ ගත කෙරුණු ඇය ඉන් වසර කිහිපයකට පසුව මහරගම පිළිකා රෝහලේදී ජීවිතක්ෂයට පත්වූයේ පිළිකා රෝගියෙකුවය. පිළිකා රෝගයට ගොදුරුව මරණය අභිමුව සිටියදී ඇය එල්.ටී.ටී.ඊ. සංවිධානය හා සම්බන්ධ සිය ක්‍රියාකාරකම් සහ බිහිසුණු අත්දැකීම් පිළිබඳ තබන ලද ලිඛිත සටහන් පසුව දෙමළ භාෂාවෙන් පොතක් ලෙස ප්‍රකාශයට පත් කෙරිණි. එහි ඇතුළත් කරුණු දෙමළ සමාජය තුළ මහත් විවාදයටද, බාහිර සමාජයේ මහත් අවධානයටද ලක්වීය.**

**අතිමහත් සමාජ පිරිවැයක් දරමින් එල්.ටී.ටී.ඊ. යුද සංවිධානය වැනසීමට රජයේ හමුදා සමත් වුවද, එම සංවිධා-නයේ නැඟීමට සහ පැවැත්මට බලපෑ හේතු නැසීමට රජය මෙතෙක් සමත්වී නැත. උතුරේ දෙමළ ජාතිවාදයද, නැඟෙනහිර මුස්ලිම් ජාතිවාදයද, දකුණේ සිංහල ජාතිවාදයද මේ මොහොතේ නව වටයකින් හිස ඔසවමින් සාමකාමී පුරවැසි සමාජයට සන්නිවේදනය කරන පනිවිඩයද බෙහෙවින් භයානකය. එවැනි පසුබිමක මද අස්වැසිල්ලක් භුක්තිවිඳිමින් සිටින දැනුම්වත් සිංහල පුරවැසි සමාජයට තමිළිනීගේ මරණාසන්න ස්මරණය මගින් ලබාදෙන පනවිඩයේ ඇති සුවිශේෂීත්වය සළකා එහි සිංහල පරිවර්තනය කොටස් වශයෙන් ඔබ වෙත ගෙනඑන්නෙමු.**

**තමිළිනී දෙමළ බසින් තැබූ සටහන් සිංහලයට නැඟූ ආචාර්ය ස්වාමිනාදන් විමල් සහ ඒ සඳහා අවශ්‍ය සෙසු සම්පත්දායකත්වය සැපයූ සිනමාවේදී ධර්මසිරි බණ්ඩාරනායක දෙපළට මෙහිදී අපගේ විශේෂ ස්තුතිය පිරිනමමු.**

සන්නසට සකස් කරන්නේ - ශ්‍රීලාල් සෙනෙවිරත්න



# තමිළිනීගේ කතාව

## 7

පැතිරුණු වෙල් යායද, එහි තැනින් තැන හැකිළී නැවී දිවෙන ඇළවල් ද, බොරලු පාරවල් ද, ගම්සූරිය ගස්වලින් යුතු වැටවල් ද මා උපන් ගම වූ පරන්තන් හි සුන්දරත්වය ඇති කරන ස්වාභාවික පරිසරයේ නිර්මාණයන්ය. ප්‍රධාන මාර්ගය වූ නවය මාර්ගයත් පූනගරී-මන්නාරම පාරත්, මුලතිව් පාරත් එක්වන සුන්දර කුඩා ගම්මානය වූයේ පරන්තන්ය. 1936 වසරේ සිට ගොවිතැන් කිරීමේ බලාපොරොත්තුවෙන් යාපනයේ සිට පැමිණි ජනතාව ක්‍රම ක්‍රමයෙන් එම ප්‍රදේශයේ ස්ථිර වාසස්ථාන තනා ගත්හ. ඔවුන්ගේ ජීවිත පිරී තිබුණේ චාම් සරල බවින්ය. පරන්තන්වල සිට දකුණු දෙසට කිලෝ මීටර් පහක දුරින් කිලිනොච්චි නගරයත්, උතුරු දෙසට කිලෝමීටර් හයක දුරින් අලිමංකඩ මුහුදු දිය පිරුණු කලපුවත් පිහිටා ඇත. පෙර කල වන්නියේ සිට ඇත් දළ සහ දැව ආදිය ගෙන ඒම වැළැක්වීමේ අරමුණින් 1760 වසරේදී පෘතුගීසීන් අලිමංකඩ මුර පොළක් ඇති කළ බවත්, පසුව 1776 වසරේදී ලන්දේසින් විසින් ද, පසුව බ්‍රිතාන්‍යයෙන් විසින්ද, 1952 වසරෙහි සිට ලංකාවේ පොලිසිය විසින් ද එම ස්ථානයෙහි සෝදිසි කිරීමේ මුර කපොල්ලක් පවත්වාගෙන එන බව කියනු ලැබේ. අලිමංකඩ ලුණු ලේවාය, පරන්තන් රසායනික කම්හල ආදිය පිහිටා තිබීම නිසාත් පරන්තන් ලංකාවේ ප්‍රසිද්ධ ගමක් විය.

ආයුධ සන්නද්ධ අරගලය ආරම්භ වූ කාලයේ සිටම පරන්තන් යනු යුදමය වශයෙන් වැදගත් ස්ථානයක් විය. එහෙයින් නිතර නිතර කූඩු අතහැර යන කුරුල්ලන් සේ පරන්තන් ජනයාගේ ජීවිතයත් බිඳී විසිරී යන්නට විය. මා උපන්නේ ද එවැනි වකවානුවකය. මාගේ පියා කන්දයියා සුබ්‍රමනියම් යාපනයෙහි අයෙකි. මව සින්නම්මා පරන්තන්වල ඉපිද හැදී වැඩුනාය. මවගේ දාහත් වන වියේ දී වැඩිමහලු දරුවා ලෙසින් මම උපන්නෙමි. මගේ අම්මාගේ තාත්තා වූ ස්වාමිනාදන් වූ මගේ මාමා උසස් පෙළ දක්වා අධ්‍යාපනය ලැබුවත් රජයේ රැකියාවක් පිළිබඳව උනන්දු නොවී ගොවිතැන ජීවිකා වෘත්තිය කරගෙන උන්නේය. මගේ සීයාගේ බාල සහෝදරයා එනම් පුංචි සීයා සේදුපතිය. ඔහු විවාහ නොවී තම වැඩිමහලු සහෝදරයාගේ පවුලේම සාමාජිකයෙකු වී උන්නේය. මහත් දුෂ්කර ලෙස ශ්‍රමය වගුරා වැඩකරන්නෙකු වූ ඔහු දැඩි ගති ගුණ ඇත්තෙක් විය. අපගේ මුළු පවුලේම පාලකයා ලෙස කටයුතු කළේ ඔහුය. එතරම්

## යුද්ධය තුළ යළි උපන්නෙමි

පළපුරුදු දක්ෂ ගොවියෙකි. ආච්චි දැඩි අම්මාන් දෙවි භක්තික කාන්තාවකි. එහෙයින් මට ශිවකාමී යන නම තැබූ බව මගේ මාපියෝ මා සමඟ පවසා ඇත. දෙමළ ජනතාවගේ ආයුධ සන්නද්ධ අරගලය ආරම්භ වූ කාලයේ උපන් හෙයින් මගේ ළමා විය ගෙවුණේ එහි බලපෑම් සමඟින්ය. මගේ පියා සෙනෙහෙවන්ත නිහඬ මිනිසෙකි. දැඩි ලෙස කියවීමේ පුරුද්දකින් යුත් මගේ පියා ඉතිහාස කතා, ආගමික කතා මෙන්ම දේශපාලන දර්ශනයන් දක්වා බොහෝ දේ කියවයි. ඔහු තමන් කියවූ දේවල් ළමා කතා බවට හරවා රාත්‍රී කාලයේදී මට කියා දෙයි.

මගේ මවගේ නව යොවුන් වියේදී උපන් මා හට බාල සහෝදරයෙක් සිටි හෙයින් මම බොහෝ විට ආච්චිලාගේ ගෙදර සුරතලයට වැඩුනෙමි. පවුලේ පළමුවෙනි මිනිබිරිය හෙයින් සියලු දෙනාම මා කෙරෙහි සෙනෙහස පෑහ. මගේ මවට සිටි එකම එක සහෝදරයා අධ්‍යාපනයක් ලබා නොසිටි මුත් ඔහුගේ ගති ගුණ සහ විනය ගරුක ජීවන ක්‍රමය දැනටත් මට පුදුම සහගතය. ළමුන් වූ අප හදා වඩා ගත්තේ තම ප්‍රාණය සේ සලකාය. මගේ මවුපියන්ගෙන් හෝ වැඩිහිටියන්ගෙන් හෝ මම කිසිම දිනෙක දඬුවම් නොලැබුවෙමි. එපමණක් නොව, ඔවුන්ගේ මුවින් කිසිම දිනෙක මා වෙත සැර පරුෂ වදනක් එල්ල වූයේ නැත.

'ජල්-ජල්' යන හඬ නැගෙන ගෙජ්ජි බැඳි ගොනු න් දෙදෙනෙකු ඇදගෙන යන කරත්තයේ පිදුරු අතුරා ඒ මත පැදුරු එළා අපි පවුලේ සියලු දෙනාම එකතුව කරඩිප්පොක්කු හන්දියට ගොස් ඊශ්වරන් හෝ පරශක්ති හෝ සිනමා ශාලාවෙන් ආච්චි කැමති ශිවාජි ගනේෂන්ගේ නැතහොත් එම්.ජී.ආර්.ගේ චිත්‍රපටියක අර්ධයක් නරඹා ඉතිරි කාලය වැඩිහිටියෙකුගේ ඔඩොක්කුවේ නිදාගෙන ඉඳ නිවෙසට පැමිණි සුන්දර මතකයන් බොහෝය.

සෙනෙහස සපිරි ඔවුන්ගේ මග පෙන්වීම කුඩා වියෙහි සිටම මා තුළ යම් කිසි නිදහස් ආකල්පයක් රෝපණය කර තිබුණි. සාමාන්‍ය ගොවි පවුලක ගැහැණු දරුවෙකු වුවත් ඔවුහු කිසිවිටෙකත් මාව යටපත් කර තම අදහස් හෝ සිරිත් විරිත් හෝ මා තුළට බලහත්කාරයෙන් පැටවීමට උත්සාහ දැරුවේ නැත. එයට වෙනස්ව යමින් හොඳින් ඉගෙන ගෙන ඉහළ තැනකට යා යුතුය යනුවෙන් මාව දිරිමත් කළහ. ඔවුන්ගේ සිහිනය වූයේ එයයි. මම ප්‍රාථමික අධ්‍යාපනයේ සිට උසස් පෙළ දක්වා අධ්‍යාපනය ලැබුවේ පරන්තන් හින්දු මහා විද්‍යාලයේදීය. මම සාමාන්‍ය පෙළ හදාරන කාලය දක්වා දුම්රිය ගමනාගමනය සිදුවූ හෙයින් බොහෝ විට යාපනයේ ගුරුවරු සහ අපගේ ප්‍රදේශයේ ගුරුවරු අපේ පාසලේ සේවය කළහ. තම සිසු සිසුවියන්ව තමන්ගේම දරුවන් සේ සලකා මඟ පෙන්වූ ගුරු භවතුන් මහා රාශියක් අපගේ පාසලෙහි උන්හ. ඔවුහු ජීවිතය පිළිබඳව උසස් සිහින තම සිසුන් තුළ රෝපණය කළහ. ඉගෙන ගෙන විශ්වවිද්‍යාලයට යා යුතුය යන්නෙහි මම දැඩි අධිෂ්ඨානයක සිටියෙමි. එහෙත් රටේ වර්ධනය වෙමින් තිබූ යුද්ධ කුණාටුවට අපගේ සාදාරණ සිහිනයන් අසුවී ගසාගෙන යනු ඇතැයි මම ඒ මොහොතේ දැනගෙන නොසිටියෙමි.

මම දැනුම් තේරුම් වියට පත්වන විට අපේ ගමේ ස්වාභාවික ජීවිතය නිතර නිතර කැළඹීමට පත්වීම ආරම්භ විය. පාරේ නිතරම තුවක්කු වෙඩි ශබ්ද ඇසෙන්නටවීම සාමාන්‍ය දෙයක් බවට පත්විය. කවුදෝ වෙඩි තැබූ බවත්, කවුදෝ මිය ගිය බවත් වැඩිහිටියෝ රහසේ කතා බහ කළහ. සමහර විට පාසල් වේලාව තුළදිත් මෙවැනි දේ සිදුවිය. එවිට මවුපියෝ පාසල් කාලය අවසන් වීමට පෙර ඇවිත් තම දරුවන්ව නිවෙසට කැඳවාගෙන යති. පාසලේ කටයුතු එදිනට අවසන් වූ බව දන්වා ගුරුවරුද පිටව යති. කඩ සාප්පු වසා දමා පාරවල් ජන ශූන්‍ය තත්ත්වයට පත්වේ. කුමන මොහොතක කුමක් සිදුවේදැයි නොදැන මර බියෙන් දින ගණන් නිවෙස්වලට වී සිටින්නෙමු. මෙවැනි දේ සිදුවීමට හේතුව කුමක්ද යන්න නොදැන සිටි එම අවධියේ යුද්ධය යන්න අපගේ කුඩා පිටකොඳු මතට මහත් බරක් පටවන්නක් විය.

මම හයේ පන්තියේ ඉගෙන ගනිමින් සිටිද්දී අපේ අසල්වැසි ගම වූ කුමාරපුරම් වෙත ගොස් සිටියෙමි. මා ඉගෙන ගනිමින් සිටි

36 වන පිටට



සුභාවිත ගීතයේ අන්තර්ජාල නවාතැන - තිසර ගුවන්විදුලිය www.thisara.com